සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

12519

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2015**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ............................................................................. විභාග අංකය :- ........................

## I කොටස

❖ 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

❖ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.

(01) සමචතුරස්‍රයකට ඇති සමමිතික අක්ෂ ගණන කීය ද?

(02) P = {1 ත් 10 ත් අතර සමචතුරස්‍ර සංඛ්‍යා} නම්, P වෙන් රූපයක දක්වන්න.

(03) 30 හි ප්‍රථමක සාධක ලියන්න.

(04) 12, 18, 20 හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

(05) බලවල ගුණිතයක් ලෙස ලියන්න. a x b x a x b x b


(06) ක්‍රි.ව.1989.04.12 අයත්වන ශතවර්ෂය කුමක් ද?

(07) මිලිග්‍රෑම්වලින් ලියන්න. 2g 25mg

(08) ආරෝහණ පටිපාටියට ලියන්න.

0 , 6 , -1 , 2 , -3

(09) රූපයේ දී ඇති කෝණය නම් කරන්න.




(10) සුළු කරන්න. 15kg ÷ 4

(11) පහත දැක්වෙන භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.


$\frac{2}{25}$

(12) ත්‍රිකෝණයක පරිමිතිය 33cmකි. එහි පාදවල දිග අතර අනුපාතය 2 : 4 : 5 නම් ත්‍රිකෝණයේ දිගම පාදයේ දිග සොයන්න.

(13) හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

සරල රේඛීය තල රූපවලින් කරනු ලබන ටෙසලාකරණයක ශීර්ෂ ලක්ෂ්‍යයක් වටා වූ කෝණවල එකතුව සෘජුකෝණ ....................... ක් වේ.

(14) රූපයේ දැක්වෙන සමාන්තර රේඛා යුගල දෙකක් ලියන්න.





(15) එකතු කරන්න.

| km | m |
|---|---|
| 6 | 62 |
| 5 | 96 |
| | |

(16) රූපයේ දැක්වෙන්නේ වෘත්තයේ කේන්ද්‍රය O වේ.

AB හා CD හඳුන්වන විශේෂිත නම් ලියන්න.





AB - ..................................................

CD - ..................................................

(17) ධාරිතාව 200$ml$ වූ කුප්පියකින් පස් වාරයක දී බෝතලයක් මුළුමනින්ම පිරවිය හැක. බෝතලයේ ධාරිතාව

(i) මිලිලීටර කීය ද? (ii) ලීටර කීය ද?

(18) රූපයේ දී ඇති බහුඅස්‍රය සවිධි බහු අස්‍රයක් ද? හේතු දක්වන්න.



(19) දිග 10cm පළල 3cm හා උස 2cm වූ ඝනකාභ හැඩැති ලී කුට්ටියක අඩංගු ලීවල පරිමාව සොයන්න.

The National e-Learning Portal for The General Education

(20) මිනිත්තු 45 හා පැය 2 අතර අනුපාතය සරලව දක්වන්න.

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ❖ පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.

(01) ඔබගේ ගුරුතුමියගේ / ගුරුතුමාගේ මඟ පෙන්වීම යටතේ සකසන ලද ප්‍රශ්න පිළිතුරු ගොනුව සිහිපත් කරගන්න. එහිදී ඔබට ලබාදුන් කාඩ්පතක් පහත දැක්වේ.

| $x$ | $y$ | $2x$ | 3 |
|---|---|---|---|
| 4 | 1 | 5 | a |
| = , > , < , + , - , x , ÷ | | | |

(a) ඉහත කාඩ්පතේ සඳහන් තොරතුරු ඇසුරින්

(i) සමීකරණයක් ලියන්න. (ii) අසමානතාවයක් ලියන්න.

(b) අසමානතාවක හා සමීකරණයක ඔබ දකින

(i) සමානකමක් ලියන්න. (ii) අසමානකමක් ලියන්න.

(c) ඉහත කාඩ්පත් ආධාරයෙන් පියුමි ලියන ලද සමීකරණයක් හා අසමානතාවක් පහත දැක්වේ.

❖ $2x - 1 = 5$ ❖ $x - 2 > 1$

(i) සමීකරණය විසඳන්න.

(ii) අසමානතාව විසඳන්න. එහි නිඛිලමය විසඳුම් සංඛ්‍යා රේඛාවක දක්වන්න.

(02) (a) අගය සොයන්න.

(i) $1\frac{1}{2} + 2\frac{1}{4}$ (ii) $1.24 \times 8$ (iii) $(-3) + (+4)$

(b) හිස්කොටුවට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

$16.12 - \square = 10.78$

(c) $a = 3$ නම් $5a^2$ හි අගය සොයන්න.

(03) (a) (i) ප්‍රතිශතයක් ලෙස දක්වන්න. 0.65

(ii) බෙදන්න. $51.18 \div 12$

(b) මා ළඟ රුපියල් 2 කාසි $x$ ගණනක් ද, රුපියල් 5 කාසි $y$ ගණනක් ද ඇත. මා ළඟ තිබූ රුපියල් 5 කාසිවලින් හරි අඩක් මල්ලීට දුන්නේ නම් මා ළඟ ඉතිරිවන මුළු මුදල $x$ හා $y$ ඇසුරින් ලියන්න.

(c) දිග 10cmක් ද, පළල 8cm ක් ද, උස 4cm ක් ද වූ ඝනකාභ හැඩැති භාජනයක ධාරිතාව ලීටර කීය ද?

(d) කෝණමානය භාවිතයෙන් පහත කෝණය අඳින්න.

$A\hat{B}C = 250^0$